# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1391 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 06/11/2023 පැය 1510

## මාධ්‍ය නිවේදනය

**01. මාරක රිය අනතුරක් - සපුගස්කන්ද පොලිස් වසම.**

2023.11.05 වන දින අළුයම් කාලයේ සපුගස්කන්ද පොලිස් වසමේ කිරිබත්ගොඩ - බියගම ප්‍රධාන මාර්ගයේ සමෘද්ධි මාවත ප්‍රදේශයේදී කිරිබත්ගොඩ දෙස සිට බියගම දෙසට ධාවනය වූ යතුරු පැදියක් බියගම දෙස සිට කිරිබත්ගොඩ දෙසට ධාවනය වූ කැබ් රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදු වී ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු තුවාල ලබා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වන වැලිමඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කැබ් රථයේ රියදුරුද තුවාල ලබා රාගම රෝහලේ ප්‍රතිකාර ලබයි. සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කල්කුඩා පොලිස් වසම.**

2023.11.05 වන දින සවස් කාලයේ කල්කුඩා පොලිස් වසමේ කුබුරුමුල්ල - පාසිකුඩා මාර්ගයේ පිරිවෙන අසලදී කුබුරුමුල්ල දෙස සිට පාසිකුඩා දෙසට ගමන් ගත් යතුරු පැදියක් මාර්ගය හරහා ගමන් කල මොණරෙකුගේ ගැටීම හේතුවෙන් පැදිකරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව විදුලි කණුවක ගැටි අනතුරක් සිදු වී ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා වාලච්චේන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වන වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කල්කුඩා පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**